# දිනන දකුණ

දක්ෂිණාංශික දේශපාලනය ප්‍රතිස්ථාපනය කිරීමේ සාමූහිකය.

මාධ්‍ය නිවේදනය

2026.05.15

## <u>2026 දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත හරහා පුරවැසියා දඩයම් කිරීමට එරෙහිව හඬ නගමු ...!</u>

2026 පෙබරවාරි 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත මගින් ශ්‍රී ලංකාවේ බදු නීතිය බලාත්මක කිරීමේ දර්ශනය භයානක ලෙස වෙනස් කිරීමට රජය කටයුතු කරමින් සිටී.

මෙමගින් මෙතෙක් පැවති සාධාරණ බදු පද්ධතිය වෙනුවට පුරවැසියා මර්දනය කරන දණ්ඩනීය යාන්ත්‍රණයක් හඳුන්වා දීමට උත්සාහ කරන බව "දිනන දකුණ සාමූහිකය" ලෙස අපි රටට අවධාරණය කරමු.

බදු අයකර ගැනීමේ සිට දඩයම් කිරීම දක්වා ගමන
අතීතයේ සිටම බදු නීතිය ක්‍රියාත්මක වූයේ "ප්‍රතිපූරණ" ආකෘතියක් මතය. එහිදී යම් බදු ගෙවන්නෙකු බදු නොගෙවන්නේ නම්, රජය කළේ අදාළ බදු මුදල සහ ඊට අදාළ දඩ මුදල් අය කරගැනීමයි.

නමුත් මෙම නව සංශෝධනය හරහා එම ප්‍රවිශ්ඨය "දණ්ඩනීය වගකීමක්" දක්වා වෙනස් කොට තිබේ.
• පැවති තත්ත්වය: වංචාව හෝ හිතාමතා බදු පැහැර හැරීමකදී දඬුවම් නියම වූ අතර, වංචා කිරීමේ චේතනාව ඔප්පු කිරීමේ භාරය රජය සතු විය.

• නව තත්ත්වය: හුදු පටිපාටිගත දෝෂ (උදා: ලියාපදිංචි නොවීම, වාර්තා ප්‍රමාද වීම) "නිරපේක්ෂ වගකීමක්" (Absolute enspace Liability) ලෙස සලකා සාපරාධී වරදක් බවට පත් කර ඇත. එනම්, වංචා කිරීමේ චේතනාවක් නොමැති වුවද, තාක්ෂණික දෝෂයක් මත වුවද පුරවැසියා අපරාධකරුවෙකු විය හැකිය.

ප්‍රජාතන්ත්‍රවාදය සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම
මෙම පනත මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් බරපතල ලෙස අභියෝගයට ලක් වේ:

1. සමානතාවයේ අයිතිය (12(1) වගන්තිය): සෑම පුරවැසියෙකුම තාක්ෂණික මට්ටමින් "අපරාධකරුවෙකු" කළ හැකි මට්ටමට නීතිය පුළුල් කිරීම හරහා, රජයට අවශ්‍ය පුද්ගලයින් පමණක් තෝරාගෙන දඩයම් කිරීමේ (Selective Enforcement) අවස්ථාව උදා වේ.

මෙය දේශපාලන පලිගැනීම් සඳහා භාවිතා කළ හැකි මර්දනකාරී ආයුධයකි.

2. අත්තනෝමතික දඬුවම්වලින් නිදහස (13 වගන්තිය): නව පනත මගින් හඳුන්වා දෙන "ලඝු කාර්යපටිපාටිය" (Summary Procedure) හරහා විධිමත් අධිකරණ පරීක්ෂාව සීමා වේ.
බදු නිලධාරියෙකු ලබාදෙන සහතිකයකට අධිකරණය තුළ අතිවිශාල නීතිමය බරක් ලබා දීම හරහා විනිසුරුවරයාගේ භූමිකාව හැල්ලු වන අතර එය බලතල බෙදීමේ මූලධර්මයට පටහැනි වේ.

3. සමානුපාතිකත්වයේ මූලධර්මය ගිලිහී යාම: රජයේ ආදායමට සතයක හෝ පාඩුවක් සිදු නොවූ තාක්ෂණික ප්‍රමාදයකට පුරවැසියෙකු සිරගත කිරීමට කටයුතු කිරීම අසමානුපාතික සහ අයුක්ති සහගත පියවරකි.

තාක්ෂණික නිලධාරිවාදයේ උගුල
රජය මෙම පියවර සාධාරණීකරණය කරන්නේ IMF ඉලක්ක සහ "අත්‍යවශ්‍යතාවයේ මූලධර්මය" පෙන්වමිනි. මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් 100% ක බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාවයක් අපේක්ෂා කළද, ඒ වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී වැටකඩොලු බිඳ දැමීම පිළිගත නොහැක.

විශේෂයෙන්ම, ඉහළ මට්ටමේ ගණකාධිකාරී සහාය නොමැති සාමාන්‍ය පුරවැසියා සහ කුඩා ව්‍යාපාරිකයා පද්ධතියේ දෝෂයක් නිසා වුවද මෙම ලඝු කාර්යපටිපාටිය යටතේ නඩු විභාගවලට මැදිවී සිරගත වීමේ අවදානමක් පවතී.

අපගේ අවධාරණය
නීතිමය ක්‍රියාවලියම දඬුවමක් බවට පත් වූ විට, නීතිය තවදුරටත් යුක්තිය පසිඳලීමක් නොවේ.එය හුදු බලහත්කාරය පෑමේ මෙවලමක් පමණි. වර්තමාන රජය මෙය පලිගැනීමක් ලෙස භාවිතා නොකරන බව පැවසුවද, මෙවැනි මර්දනකාරී නීති පොතට ඇතුළු වූ පසු, අනාගතයේදී බලයට පත්වන ඕනෑම ඒකාධිපති පාලනයකට මෙය සිවිල් සමාජය මර්දනය කිරීමට මග පාදනු ඇත.

එබැවින්, වහාම මෙම මතභේදාත්මක වගන්ති සංශෝධනය කර, පුරවැසියාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන ලෙස අපි රජයට බලකර සිටිමු.

දිනන දකුණ සාමූහිකය වෙනුවෙන්

නායකත්ව මණ්ඩලය සහ විධායක සභාව.